ප්‍රදීපය

1996 ජූනි 16 ඉරිද

# මවගේ වකුගඩු බද්ධයට හිමි නමගෙන් වකුගඩුවක්

## ප්‍රදීප පුවත පළදැරූ වගයි



තරක් වූ වකුගඩු දෙකම ඉවත්කර අලුත් වකුගඩුවක් බද්ධ කළ යුතු මහත් ජීවිත අවදානමකට ලක්ව සිටි, ජනප්‍රිය සමාජ සේවිකාවක හා කිතුනු දහම් උපදේශිකාවක වන සෙලින් පාරිස් ගුරු මාතාව තම ජීවිතය රැක ගැනීමට රුපියල් හය හත් ලක්ෂයක මුදල් නොමැතිව ළතැවුලේ සිටියදී 'ප්‍රදීපය' පල කළ පුවත මල්පල හටගත් ආකාරය ද සුවිශේෂ පුවතක් වී ඇත.

අසරණ රෝගීන්ගේ දිවි බේරා ගැනීමට 92 වරක් ලේ දන්දුන් පූජ්‍ය මාදම්පේ විජිත හිමි සිය 93 වැනි පරිත්‍යාගය ...ශයෙන් තම වකුගඩුවක් ...දීමට තෝරා ගත්තේ සෙලින් ගුරු මාතාවය. එහෙත් එම අවස්ථාවේ ඒ හිමියන්ගේ අමාශ ගත ආබාධයන් නිසා එය වැළකී ගියත් වකුගඩුවක් සොයා දීමේ භාරදූර කාර්යයේ පෙරමුණ ගත්තේය.

එහි ප්‍රතිඵල වශයෙන් පූජ්‍ය කිරිබත්ගොඩ ඥානානන්ද හිමියෝ තම සිරුරෙන් වකුගඩුවක් පරිත්‍යාග කිරීමට මහත් වූ උද්යෝගයෙන් ඉදිරිපත් වූහ! වකුගඩු බද්ධයට ඉන්දියාවට වැඩම කිරීමට සියලු වියදම් තමන්ම දරා ගත්හ. නිවැසියන් දිරිගැන්වූහ. නියමිත වෛද්‍ය පරීක්ෂණ 12 කට මුහුණ දුන්හ. රෝගියා ඇතුළු කාන්තාවන් තිදෙනාට ඉන්දියාවේදී මවක පියකු සේ මාර්ගෝපදේශකයෙක් වූහ. වකුගඩු ලබාදීමේ ශල්‍ය කර්මයට භාජනය වී දින 13 ක් ඉන්දියාවේ රැඳුණු උන්වහන්සේ කිසිදු මුදල් පරිත්‍යාගයක් හෝ වෙනයම් සංග්‍රහයක් බලාපොරොත්තු නොවී සිය දන පාරමිතාව පුරමින් පෙරළා ලක්දිවට වැඩම කළහ!

අපේ සාරධර්ම රුපියල් ශතවලින් හොඳ පාලුවන යුගයක මෙබඳු ගිහි-පැවිදි දානශීලි සුහදයන් නිසා යලි ජීවත්වීමේ වරම ලද සෙලින් පාරිස් ගුරු මාතාව ඒ සැම සියලුදෙනාම කෘතවේදීව නිති සමරන්නීය.

විශේෂයෙන් භික්ෂූන් වහන්සේ උනන්දු කැරවූ බත්තරමුල්ලේ මෛත්‍රී ධර්මායතනයේ පූජ්‍ය ගුත්තැපාන විමලබුද්ධි නායක හිමි, නවාතැන් සැපයූ මීගොමු කොච්චිකඩේ පන්සලේ නායක හිමි ඉන්දියාවේදී ශ්‍රමයෙන්, මුදලින් කැපවූ සැලේසියාන නිකායික ගුරු පියවරුන් ඒත්තුකාලේ එම නිකායික ගුරු පියවරුන් තුති බැති පෙරටුව සිහිපත් කරන්නීය.

නැණ ගුණ පිරිපුන් සමාජයක් තැනීමේ දූත මෙහෙවරක යෙදී සිටින කිතුනු ගුරු මැණි කෙනෙකු ජීවත්කර ගැනීමේ වටිනාකම සලකා පටු ආගම් භේද වලින් තොර හුදු මානව හිතවාදයෙන් ඇප කැප වූ ආදර්ශවත් බුදු සාදු වරුන්ගේ ගුණ සුවඳ ද අප සමාජය සුගන්ධවත් කරන්නේය!

**පුෂ්පානන්ද පීරිස්**